# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1824/31 - 2013 අගෝස්තු මස 24 වැනි සෙනසුරාදා - 2013.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ පුත්තලම ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

උප සභාපති, සභාපති ධූරයට පත් වීම හේතු කොට ගෙන පුත්තලම ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, උප සභාපති වන බමුණු ආරච්චිගේ නිමල් බමුණු ආරච්චි නම් වූ උප සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ පුත්තලම ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා පෝරුතොටගේ සුනිල් ප්‍රනාන්දු මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පුත්තලම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී කහඳව ආරච්චිගේ සුමිත් චන්දන වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, පෝරුතොටගේ සුනිල් ප්‍රනාන්දු මහතා පුත්තලම ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කේ. ඒ. සුමිත් චන්දන,
තේරීම්භාර නිලධාරී,
පුත්තලම ප්‍රාදේශීය සභාව.

2013 අගෝස්තු මස 15 වන දින,
මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

09 - 149

1A - G 18165— 175 (2013/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

**තණමල්විල ප්‍රාදේශීය සභාව**

තණමල්විල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන ඩබ්. එම්. කරුණාදාස මහතා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අත හැර ඇති බව තණමල්විල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සුරංග අඹගහතැන්නෙ වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

සුරංග අඹගහතැන්නෙ,
තේරීම්භාර නිලධාරී,
තණමල්විල ප්‍රාදේශීය සභාව.

2013 අගෝස්තු මස 15 වන දින,
මැතිවරණ කාර්යාලය,
මොනරාගල.

09 - 150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.